Sri Lanka Gazette masthead

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2066/30 – 2018 අප්‍රේල් 11 වැනි බදාදා – 2018.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

*මගේ අංකය*: IR/21/28/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2057/26 දරන හා 2018.02.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක. 301 හි පිහිටි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කැලණිය, වේවැල්දූව, අංක 130 හි පිහිටි පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3454 දරන හා 2017.10.25 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3454 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2019.02.08 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. වීමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

## පළමුවන උපලේඛනය

## ''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

## 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

## බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : 130, වේවැල්දූව, කැලණිය.
දිනය : 2018.02.23

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2018.02.08 දිනැති අංක 2057/26 දරන *ගැසට් පත්‍රයේ* පලකරන ලද්දාවූ ද පැක්සර්ව් (පුද්) සමාගම සහ ශ්‍රී. ල. නි. සේ. සංගමය බැඳී සිටින්නාවූ ද 2017.10.25 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,**

04 - 934

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.